සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

---

01. ආසියා මහද්වීපයට උතුරින් ................................ සාගරය පිහිටා ඇත.
    (ආක්ටික්/ පැසිෆික්/ ඇන්ටාක්ටික්)
02. ............................................... ගඟ කැස්පියන් මුහුදට ගලා බසී.
    (අමූර්/ යුරල්/ ලීනා)
03. කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර ............................ දේශගුණ කලාප පිහිටා ඇත.
    (නිවර්තන/ සෞම්‍ය/ ශීත)
04. මොංගොලොයිඩ් මානව වර්ගයට අයත් ජනයා බහුතරයක් වාසය කරන රටක් ලෙස ............................................ වැදගත් වේ. (ඇෆ්ගනිස්ථානය/ මාලදිවයින/ දකුණු කොරියාව)
05. කොළඹ, ගාල්ල වැනි නගර ශ්‍රී ලංකාවේ ....................................................................... පිහිටා තිබේ.
    (වෙරළබඩ තැනිතලාවේ/ අභ්‍යන්තර තැනිතලාවේ/ මධ්‍යම කඳුකරයේ)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදිනම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06. ජපානයේ "හොන්ඩා" සහ "සුසුකි" සමාගම් මෝටර් රථ මෙන්ම මෝටර් සයිකල් ද නිපදවනු ලබයි. ( )
07. "ජෙබිල් අලි" යනු ඩුබායි හි ඇති නිදහස් වෙළෙඳ වරායකි. ( )
08. කුරුණෑගල නගරය ආසන්නයේ පිහිටා ඇති "ඇතුගල" ශේෂ කන්දකට උදාහරණයකි. ( )
09. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න 105 ක් තිබේ ( )
10. රුසියාවේ වර්කොයැන්ස් ප්‍රදේශය ආසියාවේ වැඩිම උෂ්ණත්වයක් වාර්තා වන ප්‍රදේශයයි ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ආසියාවේ දිගම ගංගාව වන්නේ,
    1. හොවැංහෝ ගඟයි. 2. මීකොං ගඟයි. 3. යැංසි ගඟයි. 4. ඉන්දු ගඟයි.
12. නිවර්තන වර්ෂා වනාන්තර වල දක්නට ලැබෙන ශාක වර්ග පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?
    1. මැහෝගනී, කළුවර, හඳුන් 2. ඕක්, මල්බෙරි, චෙස්නට්
    3. පයින්, ෆර්, ස්ප්‍රෑස් 4. රොස්වුඩ්, ලාච්, බීච්
13. ශ්‍රී ලංකාවේ දෙවන අන්තර් මෝසම ක්‍රියාත්මක වන කාල සීමාව වන්නේ,
    1. පෙබරවාරි සිට මාර්තු දක්වා ය. 2. ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා ය.
    3. දෙසැම්බර් සිට ජනවාරි දක්වා ය. 4. මාර්තු සිට අප්‍රේල් දක්වා ය.
14. ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයට ලැබෙන සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය,
    1. මි.මී. 2000 ට වැඩිය. 2. මි. මී. 1250 - 2000 අතර වේ.
    3. මි. මී. 1750 - 2000 අතර වේ. 4. මි. මී. 650- 1250 අතර වේ.

15. ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යාවක් ව්‍යාප්තව ඇති පළාත මින් කුමක්ද?
 1. ඌව පළාත  2. උතුරු මැද පළාත  3. උතුරු පළාත  4. සබරගමු පළාත

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න**

16. පාකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික වගා කන්න දෙක කාරිෆ් හා ................................ යනුවෙන් හඳුන්වයි.
17. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව ලොව තුන්වන විශාලම ආර්ථිකය හිමි රට වන්නේ .......................... යි
18. ගම්පහ සහ ............................. ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යා ව්‍යාප්තියක් ඇති දිස්ත්‍රික්ක වේ.
19. ශ්‍රී ලංකාවට විදුලිය සපයන මාර්ග අතර තාප විදුලිය සහ ................................. විදුලිය ප්‍රධාන වේ
20. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය හා වියළි කලාපය වෙන් කෙරෙන ගංගා දෙක වන්නේ දැදුරු ඔය හා ..................... ගඟ යි.


---

## II කොටස

(1)

අ) පහත දැක්වෙන ආසියා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (ල.8)


i. A අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?
ii. B අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?
iii. C අක්ෂරයෙන් දැක්වෙන මුහුද කුමක් ද?
iv. D අක්ෂරයෙන් දැක්වෙන නගරය කුමක් ද?
v. උතුරු චීන තැන්න දැක්වෙන අක්ෂරය කුමක් ද?
vi. පර්සියන් බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?
vii. කොකේසස් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?
viii. පාමීර් සානුව දැක්වෙන අක්ෂරය කුමක් ද?




ආ) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර ඇති ස්ථාන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) පහත සඳහන් ස්ථානවලට හිමි අක්ෂර සිතියමෙන් තෝරා ලියන්න
 i. දෙවුන්දර තුඩුව
 ii. ඩෙල්ෆ්ට් දූපත
 iii. මහනුවර දිස්ත්‍රික්කය
 iv. සිංහරාජ වනාන්තරය (ල. 4)

b) පහත සඳහන් අක්ෂර වලින් පෙන්නුම් කරන ලක්ෂණ සිතියමෙන් තෝරා ලියන්න
 i. J අක්ෂරයෙන් දැක්වෙන ගඟ
 ii. K අක්ෂරයෙන් දැක්වෙන නගරය
 iii. L අක්ෂරයෙන් දැක්වෙන ශේෂ කන්ද
 iv. M අක්ෂරයෙන දැක්වෙන කලපුව (ල. 4)



2)


i. ආසියානු ප්‍රදේශය තුළ බිහිවූ ඉපැරණි මානව ශිෂ්ටාචාර තුන සඳහන් කරන්න (ල.3)

ii. ආසියානු ප්‍රදේශය ලෝකයේ සුවිශේෂී කලාපයක් ලෙස වැදගත් වීමට හේතුවන කරුණු 4ක් ලියන්න (ල.4)

iii. a) සෞම්‍ය කලාපය තුළ ව්‍යාප්තව ඇති වනාන්තර වර්ගය කුමක්ද?

b) එම වනාන්තර වර්ගයේ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ල.4)

3)





i. යාබදව ඇති ශ්‍රී ලංකා සිතියමේ අංක 1, 2 හා 3 න් දැක්වෙන භූ විෂමතා කලාප තුන පිළිවෙලින් නම් කරන්න (ල.3)

ii. අංක 1 කලාපයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ දෙකක් සඳහන් කර ඊට උදාහරණයක් බැගින් ලියන්න. (ල.4)

iii. අංක 3 කලාපය තුළ සිදු කෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් හතරක් සඳහන් කරන්න (ල.4)

4)




i. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා කලාප දැක්වෙන යාබද සිතියමේ A, B හා C අක්ෂර වලින් දැක්වෙන වනාන්තර වර්ග තුන නම් කරන්න (ල.3)

ii. a) ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා වර්ග කිරීමට පදනම් කර ගත් දේශගුණික සාධක දෙක සඳහන් කරන්න

b) F වලින් දැක්වෙන වෘක්ෂලතා කලාපයට අයත් වන දිස්ත්‍රික්කයක් සඳහන් කරන්න (ල.3)

iii. කඩොලාන වෘක්ෂලතා ඇසුරින් පහත තේමාවලට පිළිතුරු සපයන්න.

a) ව්‍යාප්ත ප්‍රදේශ දෙකක්,

b) ප්‍රධාන ශාක වර්ග දෙකක්,

c) කඩොලාන වෘක්ෂලතා වල විශේෂ ලක්ෂණයක් සඳහන් කරන්න. (ල.5)

5)

i. අධික ජන සංඛ්‍යාවක් වෙසෙන පහත සඳහන් නගර අයත් වන රටවල් පිළිවෙලින් ලියන්න (ල.3)

a) ෂැංහයි

b) තෝකියෝ

c) නව දිල්ලිය

ii. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ අධික ජන සංඛ්‍යාවක් ඒකරාශී වීමට බලපා ඇති හේතු හතරක් සඳහන් කරන්න (ල.4)

iii. a) නාගරික ජනාවාස ආශ්‍රිතව මතු වී ඇති ගැටළු දෙකක් ලියන්න

b) ඉන් එක් ගැටළුවක් විසඳාගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)

6)

i. කාලගුණය යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න (ල.3)

ii. ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් වලට බලපාන සාධක හතරක් සඳහන් කරන්න (ල.4)

iii. a) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රම දෙකක් සඳහන් කරන්න

b) ඉන් එක් ක්‍රමයක් මගින් වර්ෂාව ලැබෙන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ල.4)

7)

i. රටක ආර්ථික ක්‍රියාකාරකම් බෙදා දක්වන ප්‍රධාන අංශ තුන සඳහන් කරන්න (ල.3)

ii. ශ්‍රී ලංකාව තුළ සත්ව පාලන කටයුතු සිදු කෙරෙන ප්‍රදේශ හතරක් සඳහන් කරන්න (ල.4)

iii. a) ශ්‍රී ලංකාව තුළ කර්මාන්ත වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති පළාත කුමක්ද?

b) මාර්ග හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා මෑත කාලයේ ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)